| | | | |
|---|---|---|---|
| කොවිඩ් 19 සති පාසල | | | |
| සබරගමුව | | | |
| විෂය- ඉතිහාසය | ශ්‍රේණිය - 09 ශ්‍රේණිය | වාරය-III | සතිය - 05 |

**ඒකකය-05 -ශ්‍රී** ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික නිදහස් ව්‍යාපාරය

**පැවරුම් අංක-**05

**ක්‍රියාකාරකම අංක-**04-මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණය හා ඩොනමෝර් ප්‍රතිසංස්කරණය හදුනා ගනිමු.

**හැදින්වීම-**1920 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන්(මැනිං) ලාංකිකයන්ගේ අපේක්ෂාවන් ඉටු නොවුණු නිසා ලාංකිකයන් විසින් දිගින් දිගටම සිය උද්ඝෝෂණ සිදුකරනු ලැබීය.ඒ අනුව 1924 දී යටත්විජිතභාර ලේකම් ඩෙවොන්ෂයර් විසින් මෙම ප්‍රතිසංස්කරණය හදුන්වා දුන් අතර ඒ සදහා මැනිං ආණ්ඩුකාරවරයාගේ නිර්දේශ පදනම් කරගත් නිසා එය මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණය නම් විය.1920 ප්‍රතිසංස්කරණය මෙරට ක්‍රියාත්මක වූයේ ඉතා කෙටි කාලයකි.එහි පැවති ප්‍රධාන දුර්වලතාවය වූයේ පාලන බලතල හා වගකීම් විසන්ධිව පැවතීමයි.එය රටේ පරිපාලනය දුර්වල කිරීමට හේතුවිය.ඒ නිසා 1931 දී ඩොනමෝර් කොමිසමේ යෝජනා පදනම් කරගනිමින් ඩොනමෝර් ප්‍රතිසංස්කරණය මෙරටට හදුන්වා දෙන ලදී.

**සිසු උපදෙස්-**

**පියවර 01-** පෙළපොතෙහි පිටු අංක 106 සිට 110 දක්වා හොදින් කියවන්න.

**පියවර 02-** පසුගිය සතිපාසල් පැවරුම් සටහන් අවසන් කළ ස්ථානයට පිටින් ඉහතින් දී ඇති හැදින්වීම සටහන් කරගන්න.

**පියවර 03-** පහතින් දී ඇති ප්‍රශ්නාවලිය සඳහා පිළිතුරු සපයන්න.(එහිදී පිළිතුරු ලිවීමට පෙර අදාළ ප්‍රශ්නය සටහන් කර පිළිතුරු ලිවීම අනිවාර්ය වේ.)

**ප්‍රශ්නාවලිය-**

1) මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සඳහා නිර්දේශ ඉදිරිපත් කළ ආණ්ඩුකරු වන්නේ කවුරුන්ද?
2) මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණය මෙරටට හදුන්වාදුන් සමයේ යටත්විජිතභාර ලේකම්වරයා ලෙස කටයුතු කළේ කවුරුන්ද?
3) මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණය යටතේ ඇතිකළ ව්‍යවස්ථාදායක සභාවේ සංයුතිය ඇද දක්වන්න.
4) මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණයේ පැවති පුධාන දුර්වලතාවය කුමක්ද?
5) ඩොනමෝර් කොමිසම මෙරටට පත්කර එවන ලද වර්ෂය කුමක්ද?
6) ඩොනමෝර් කොමිසමේ ප්‍රධානියා නම් කරන්න.
7) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යෝජනා ලියා ඒවා කෙටියෙන් විස්තර කර දක්වන්න.
8) ඩොනමෝර් ප්‍රතිසංස්කරණය තුළ ව්‍යවස්ථාදායකයා හැදින්වූයේ කුමන නමකින්ද?
9) ඩොනමෝර් ප්‍රතිසංස්කරණය තුළින් හදුන්වාදුන් රාජ්‍යය නිලධාරීන් තිදෙනා නම් කරන්න.
10) සර්වජන ඡන්ද බලය හිමිවූ ප්‍රථම ආසියාතික රට කුමක්ද?

**සැකසුම- .උදාර අරවින්ද-නිවිතිගල අධ්‍යාපන කලාපය-.(ර/නිවි/කලවාන ජාතික පාසල)**